www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය ඉන්දියානු අර්ථිකයේ හෙලෙත්තාඩුව එළිදරව් කරයි

## International financial crisis exposes vulnerability of Indian economy

**කේ. රත්නායක විසිනි**
**2008 ඔක්තෝබර් 13**

ගෝලීය මූල්‍ය අර්බුදය සහ එලෙඹෙමින් පවතින ආර්ථික පසුබෑම ඉන්දියානු ආර්ථිකයේ දුර්වලතා සැනින් එළිදරව් කල අතර රටේ ඊනියා ආර්ථික ප්‍රාතිහාර්යය පිලිබඳ මිත්‍යාවන් සුන් කර දැමීය. සැලකිය යුතු තරමේ ආර්ථික පසුබෑමක් එලඹීමේ භීතිකාවන් මධ්‍යයේ, පසුගිය සතිය තුල දී බොම්බායේ කොටස් වෙලඳපොලේ (බීඑස්ඊ) සෙන්සෙක්ස් දර්ශකය සියයට 16ක් තරම් ප්‍රමානයකින් කඩා වැටුන අතර ඩොලරයට සාපේක්ෂව රුපියල තව දුර අවප්‍රමාන විය.

ඉන්දියානු මහ බැංකුව (ආර්බීඅයි) පසුගිය සතියේ දෙවන වරටත් මැදහත් වෙමින් මූල්‍ය පද්ධතියට රුපියල් බිලියන 600ක් (ඇමරිකානු ඩොලර් බිලියන 13ක් පමන) එන්නත් කරමින් මුදල් සංචිත අනුපාතය සියයට 7.5 දක්වා සියයට 1කින් කපා හැරීමට පෙරාතුව, එම සිකුරාදා සෙන්සෙක්ස් දර්ශකය සියයට 10 කට ආසන්න ප්‍රමානයකින් පහත වැටුනි. දිනය අවසානයේ බීඑස්ඊ සෙන්සෙක්ස් අගය සියයට 7.1 කින් පහත වැටී ඒකක 10,527.85ක් වූ අතර වඩා පුලුල් ජාතික කොටස් වෙලඳපොලේ (එන්එස්ඊ) නිෆ්ටි දර්ශකය සියයට 6.65ක් අහිමි කර ගත්තේ ය.

දිනය අවසන් වන විට ඉන්දියාවේ විශාලතම පෞද්ගලික මූල්‍ය සමූහය වන අයිසීඅයිසීඅයි බැංකුව සියයට 20කින් පහත වැටීමට පෙර සියයට 28ක් තරම් විශාල අගයකින් කඩා වැටුනි. මෙම සමූහය ගෝලීය මූල්‍ය වෙලඳපොලේ නිරත වන පලල් මට්ටමේ ක්‍රියාකාරීත්වයන් පිලිබඳව ඇති වූ උත්සුකතා මධ්‍යයේ පසුගිය සැප්තැම්බරයේ සිට එහි කොටස් අගය සියයට 46කින් පහලට වැටී ඇත. ඉන්දියාවේ දෙවන විශාලතම ජංගම දුරකථන සමාගම වන රිලයන්ස් කොමියුනිකේෂන්ස් කොටස් මිල සියයට 21කින් කඩා වැටුන අතර විශාලතම නිවාස හා දේපල සංවර්ධන ආයතනය වන සීමාසහිත ඩීඑල්එෆ් සමාගමේ සියයට 8.8කින් ද ප්‍රධාන ඉංජිනේරු සමාගමක් වන ලාර්සන් ඇන්ඩ් ටෝ(ර්)බ්රෝ සමාගමේ සියයට 8කින් ද අගය අඩු වී ගියේ ය.

බීඑස්ඊ සෙන්සෙක්ස් දර්ශකය 725කින් කඩා වැටීමෙන් අනතුරුව සඳුදා වන විටම ආර්බීඅයි මුදල් සංචිත අනුපාතය හෙවත් මහ බැංකුව අතේ පවතින තැන්පතු අනුපාතය සියයට 0.5කින් කපා හැර තිබුනි. එදින ම ඉන්දියානු කොටස් වෙලඳ පොල මන්ඩලය දුර්වල වන රුපියල රැක ගනු වස් විදේශීය ආයතනික ආයෝජකයන් මත පසුගිය වසරේ ඔක්තෝබරයේ සිට පනවා තිබූ සීමා බන්ධන ඉවත් කර දැමී ය. ඩොලරයක් සඳහා ජනවාරියේ දී 39ක් වූ රුපියල එම සිකුරාදා වන විට 49ක් දක්වා කඩා වැටුනි.

ආන්ඩුව ලබා දුන් සහතික කිරීම් නොතකා සිකුරාදා කොටස් මිල ගනන් කඩා වැටුනේ ය. බ්‍රහස්පතින්දා කැබිනට් රැස්වීමෙන් එලියට බසිමින් මුදල් අමාත්‍ය පී. සිදම්බරම් කුලප්පු වීමට උවමනාවක් නැතැයි ප්‍රකාශ කලේ ය. ''ඉන්දියානු බැංකුවල ප්‍රාග්ධනය යහමින් තිබේ, ඒවා මූල්‍ය වශයෙන් ශක්තිමත් ය,'' යනුවෙන් ඔහු පැවසී ය. එසේ නමුත්, කැබිනට් මන්ඩලය, දොරගුල් ලාගෙන පැවති රැස්වීමක දී, හදිසි මූල්‍ය කමිටුවක් පත් කිරීමට තීන්දු කොට අගමැති මන්මෝහන් සිං ජාතිය අමතා කතා කල යුතු ද නැද්ද යන්න සාකච්ඡා කර තිබුනි.

ඉන්දියානු ගුවන් සමාගම් සම්මේලෙය (එෆ්අයිඒ) ගුවන් සමාගම් ගොඩගැනීම පිනිස ඩොලර් බිලියන 1ක පොලී රහිත නයක් මෙන්ම වෙනත් සහනයන් ද ඉල්ලා සිටිය බව සෙනසුරාදා *ටයිම්ස් ඔෆ් ඉන්දියා* පුවත්පත වාර්තා කලේ ය. එෆ්අයිඒ නිලධාරීහු අගමැති කාර්යාලයට ඉදිරිපත් කල කරුනු දැක්වීමක දී, ජාත්‍යන්තර නය හැකිලීමක, දැඩි ගෝලීය තරඟකාරීත්වයේ සහ මගී සංඛ්‍යාව පහල වැටීමේ බලපෑම පිලිබඳව උත්සුකතා පල කලහ.

බීඑස්ඊ සෙන්සෙක්ස් දර්ශකය ජනවාරි 8 වන දා ඉහල උපරිමයේ වූ 20,873ක අගයේ සිට සිකුරාදා දිනය අවසානයේ 10,528ක් දක්වා සියයට 50කට ඉතා ආසන්න මට්ටමකින් වසර තුල දී කඩා වැටී ඇත. ජනවාරියේ දී ඩොලර් ට්‍රිලියන 1.8ක් වූ ඉන්දියානු කොටස්වල සමුච්චිත වෙලඳපොල ප්‍රාග්ධනකරනය රුපියල අවප්‍රමාන වෙද්දී වඩාත් නාටකාකාරව ඩොලර් බිලියන 760ක් දක්වා පහත වැටී ඇත.

මේ වසරේ මුල් නව මාසය තුල ඩොලර් බිලියන 9.6ක් වටිනා කොටස් විකුනා දමමින් විදේශ ආයෝජකයන් බුරුතු පිටින් ඉන්දියානු වෙලඳ පොල හැර දමා ගොස් තිබේ. මෙය පසුගිය වසරේ ඉන්දියානු ප්‍රාග්ධන වෙලඳපොලට ඩොලර් බිලියන 17.2ක වාර්තාගත ආයෝජන ප්‍රමානයක් ගලා ඒමේ තියුනු ආපසු හැරීමකි. 2008 වසරේ අවසන වන විට පිටතට ගලා ගිය මුලු ප්‍රාග්ධන ප්‍රමානය ඩොලර් බිලියන 13. 5 දක්වා නැගිය හැකි යයි සමහර විශ්ලේශකයෝ අනාවැකි කියති.

පසුගිය සිකුරාදා නිකුත් කල අගෝස්තු මස ආර්ථික සංඛ්‍යා ලේඛන, ආර්ථිකය දැනට මත් මන්දගාමී වෙමින් පවතින බැව් අනාවරනය කලා ය. මාසය තුල යටිතල පහසුකම් අංශය වර්ධනය වූයේ ගිය වසරේ අගෝස්තුවේ සියයට 9.5ට සංසන්දනාත්මකව සියයට 2.3කින් පමනකි. අගෝස්තුවේ කාර්මික ක්ෂේත්‍රය වර්ධනය වූයේ පෙර වසරේ එම මාසයේ වර්ධන වේගය වූ සියයට 10.9ට විපරීතව හුදු සියයට 1.3කින් පමනි.

අගමැතිවරයාගේ ආර්ථික උපදේශක මන්ඩලයේ සාමාජිකයකු වූ එම්. ගෝවින්ද රාඕ, සංඛ්‍යා ලේඛන ''කාර්මික පසුබෑමක්'' පෙන්නුම් කරන බව පිලිගත්තේ ය. ''අප මුහුන දෙන්ට යන්නේ මීටත් වඩා බරපතල වන ගැටලුවලටයි'' යයි පවසමින් දල දේශීය නිෂ්පාදනයේ (දදේනි) වර්ධනය ලබන වසරේ දී සියයට 7ක් දක්වා පල්ලම් බැසිය හැකි යයි ද ඔහු පිලිගත්තේ ය. ඉන්දියානු ආර්ථිකය 2003 සිට සියයට 8.7ක සාමාන්‍ය අගයකින් වර්ධනය වෙමින් පැවති අතර මීට පෙර දී ආන්ඩුව 2012 වන විට සියයට 10 දක්වා ඉහල යන, මේ වසරේ සියයට 9ක වර්ධනයක් පිලිබඳව ද අනාවැකි කියා තිබුනි.

ඉන්දියාවට ගෝලීය අවගමනයෙන් ගැලවී යා නොහැක. පසු ගිය දශක දෙක මුලුල්ලේ අනුප්‍රාප්තික ආන්ඩු රට දැවැන්ත ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තන කර ඇත. විශේෂයෙන්ම ඒ අධි තාක්ෂනික තොරතුරු තාක්ෂනය (අයිටී) සහ ඒ හා බැඳුන අන් ව්‍යාපාර සේවාවන් සඳහා ය. අගමැති මන්මෝහන් සිං සහ මුදල් ඇමති චිදම්බරම් යන දෙදෙනාම 1990 ගනන් මුල භාගයේ පෘථුල ප්‍රතිව්‍යුහකරන විධිවිධාන ආරම්භ කිරීමේ දී ප්‍රධාන භූමිකාවක් ඉටු කලේ ය.

මෙම මාසයේ *ෆිගාරෝ* සඟරාව සමග පැවැති සම්මුඛ සාකච්ඡාවක දී සිං ගෝලීය ආර්ථික මන්දගාමීත්වයක් ''ඉන්දියාවේ අපනයන වෙලඳපොල අමාරුවේ හෙලනු'' ඇතැයි පිලිගත්තේ ය. ආර්ථික පසුබෑමක් කරා ගමන් කරන උතුරු ඇමරිකාවත් යුරෝපීය සංගමයත් ඉන්දියාවේ අපනයනවලින් පිලිවෙලින් සියයට 16කට හා සියයට 21කට වග කියයි. වේගයෙන්ම වර්ධනය වන අංශය -- තොරතුරු තාක්ෂනය සහ ව්‍යාපාර සන්තතිය බාහිරට පැවරීම (බීපීඕ) හා දැනුම් සන්තතිය බාහිරට පැවරීම (කේපීඕ) ලෙස ප්‍රසිද්ධ සේවාවන් -- බරපතල ලෙස බලපෑමට ලක්වීමට ඉඩ තිබේ.

ඉන්දියාව සමහර අවස්ථාවල දී ''ලෝකයේ කාර්යාලය'' යන පටබැඳි නාමයෙන් හැඳින්වේ. ඒ ලොව පුරා සිටින ප්‍රධාන සංගත ව්‍යාපාරික සේවා පිරිවැය කපා හැරීම පිනිස ඉන්දියාවේ විශාල ලෙස සිටින මනා පුහුනුවක් සහිත ඉංග්‍රීසිය වහරන උපාධිධාරීන්ව සූරාකෑම නිසා ය. 2003-2004 දී අපනයන ආදායම ලෙස ඩොලර් බිලියන 3.1ක් ඉපයූ බීපීඕ සහ කේපීඕ සේවාවන් 2006-2007 දී එම ඉපයුම ඇමරිකානු ඩොලර් බිලියන 8.4ක් දක්වා ඉහල දමාගත්තේ ය. එම කාල සීමාව තුල දී එම ක්ෂේත්‍රයේ රැකියා සංඛ්‍යාව 216,000 සිට 553,000 දක්වා ඉහල ගිය බව ද මෙම මුදල් වර්ෂය තුල එය 700,000 දක්වා ඉහල යනු ඇතැයි බලාපොරොත්තු වන බව ද නැස්කොම් වාර්තා කරයි.

පසුගිය වසරේ ඉන්දියාවේ බීපීඕ සහ කේපීඕ අපනයනයන්ගෙන් සියයට 61ක් ගියේ එක්සත් ජනපදයට ය. එක්සත් ජනපදයේ ෆෝර්චූන් 500 සමාගම්වලින් සියයට 40ක් පමන සිය ව්‍යාපාර සේවාවන් බාහිරට පැවරීමේ දී ඉන්දියාව කෙරේ වැඩි මනාපයක් දක්වයි. අයිඩීබීඅයි ප්‍රාග්ධන වෙලඳපොල සේවා පර්යේෂන අංශයේ ප්‍රධානී ශාහිනා මුකාදම් මෙසේ අනතුරු අඟවයි, ''ආර්ථික මන්දගාමීත්වය ඉන්දියාවේ බීපීඕ ආයතන කෙරේ බලපෑමක් ඇති කරනු ඇත. අවසානයේ දී මෙය බීපීඕ කර්මාන්තයේ සමස්ත මන්දගාමීත්වයට හේතු වනු ඇත.''

*ඉකොනමික් ටයිම්ස්* මෙසේ පැහැදිලි කලේයඃ ''ඉන්දියාවේ තොරතුරු තාක්ෂන-බීපීඕ ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක වන සමාගම්වලින් සියයට 60ක පමන ප්‍රමානයක් සේවා සපයමින් සිටින්නේ ගෝල්ඩ්මන් සැක්ස්, වොෂින්ටන් මියුචුවල්, සිටි ගෘෘප්, බැන්ක් ඔෆ් ඇමරිකා, මෝගන් ස්ටැන්ලි සහ ලේමන් බ්‍රද(ර්)ස් වැනි ඇමරිකානු මූල්‍ය සංගතයන්ට ය. ටාටා කන්සල්ටන්සි සර්විසස් සහ සත්‍යම් කොම්පියුටර්ස් මෙරිල් ලින්ච් ආයතනයට සේවා සපයන අතර වයිප්‍රෝ සමාගමේ සේවා දායකයන් අතර වර්තමාන කඩා වැටීමේ දී පහර වැදී තිබෙන ඇමරිකානු සංගත ගනනාවක් ම ඇත.''

ලිපිය තව දුරටත් මෙසේ පවසයිඃ ''බැංගලෝර්, හයිද්‍රාබාද්, චෙන්නායි, ගුර්ගඕන්, නොයිදා ආදී තැන්වල රැකියාවලින් දොට් දැමීම් ඒකාන්තයෙන් ම සිදුවන බව ඕනෑම අයකුට සිතා ගත හැක.'' මූල්‍ය අර්බුදය බීපීඕ සහ අනෙකුත් තොරතුරු තාක්ෂන අංශවල වැඩ කරන මිලියන 2.3ක් වන තරුන සේවකයන්ට බලපාන බවට ද එය අනාවැකි පල කලේය.

ආර්ථික අර්බුදයෙන් තදින්ම බැටකනු ඇත්තේ, දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ ප්‍රතිඵල ලෙස දැනටමත් ජීවන තත්වයන් පහත වැටී ඇති, ඉන්දියානු සමාජයේ

දිලිඳුම ස්ථරයන් ය. ඉන්දියාවේ පෝසතුන් හා දුප්පතුන් අතර සමාජ පරතරය අති විශාල ය. මාර්තුවේ දී ෆෝර්බ්ස් සඟරාව වාර්තා කලේ රටේ බිලියනපතියන් සංඛ්‍යාව 53 දක්වා ඉහල ගොස් ඇති බවත් සහ ඔවුන්ගේ ඒකාබද්ධ ධනස්කන්ධය රටේ දදේනියෙන් සියයට 31කට සමාන බවත් ය. ඒ සමග ම, මෑත ලෝක බැංකු වාර්තාවක සඳහන් වූයේ ජනගහනයෙන් සියයට 42ක් නැතහොත් මිලියන 456ක් නිල දරිද්‍රතා රේඛාව වන දිනකට ඇමරිකානු ඩොලර් 1.25 මට්ටමින් පහල ජීවත් වන බවය.

ගෝලීය ආර්ථික පසුබෑම රෙදි පිලි හා ඇඟලුම් ඇතුලු ඉන්දියානු ආර්ථිකයේ අනෙකුත් ප්‍රධාන අපනයන අංශවලට ද වල කපමින් දැවැන්ත දොට්ට දැමීම් දෙසට මග පාදනු ඇත. දැනට සෑම වසරක් පාසා ම තරුනයන් මිලියන 14ක් ශ්‍රම වෙලඳපොලට ඇතුලු වන අතර රැකියා ලැබෙන්නේ ඉන් මිලියන 10කට පමනි. ඉන් ඉතා වැඩි ප්‍රමානයක් ඉතා අඩු වැටුප් තලවලට ය. මිල ඉහල යාම් දැනටමත් ජීවන තත්වයන් බාදනය කරමින් සිටී. ඉන්දියාවේ උද්ධමන අනුපාතිකය අගෝස්තුවේ දී 13 වසරකට පසුව ආ එහි උපරිමය වන සියයට 12.63ක් වූ අතර තවමත් සියයට 12 මට්ටම වටා රැඳී පවතී. දුර්වල වන රුපියල මිල ගනන් තව තවත් ඉහල දමනු ඇත.

කොන්ග්‍රසයේ නායකත්වයෙන් යුතු සභාග ආන්ඩුව මූල්‍ය පද්ධතියට මුක්කු ගැසීම පිනිස ඩොලර් බිලියන ගනන් පොම්ප කරන නමුදු නාගරික හා ගම්බද දුගීන්ගේ දුක් වේදනා සමනය කිරීමේ කිසිදු සැලැස්මක් එයට නැත. 2004 දී කොන්ග්‍රසය බලයට පැමිනියේ පෙර තිබූ භාරතීය ජනතා පක්ෂය (බීජේපී) නායකත්වය දුන් ආන්ඩුවේ ආර්ථික ප්‍රතිසංස්කරනවල සමාජ බලපෑම් පිලිබඳව පුලුල්ව පැතුරුනු කෝපයේ ප්‍රතිඵලයක් ලෙස වුව ද, මොවුන් ක්‍රියාවට නැංවූයේ ජාතික ග්‍රාමීය රැකියා සහතික කිරීමේ ව්‍යාපෘතියත් ඇතුලු සීමිත සමාජ පියවරයන් පමනකි.

සිං ආන්ඩුව මූල්‍ය හා ව්‍යාපාර ක්ෂේත්‍රවල ඉසුරුමත් ප්‍රභූව රැක ගැනීම සඳහා ගමන් කිරීමේ දී, අනිවාර්යයෙන් ම එහි මිල ගෙවීමට සිදු වනු ඇත්තේ දැනටමත් එදිනෙදා වේල පිරිමසා ගැනීමට දඟලන කෝටි ගනන් සාමාන්‍ය වැඩ කරන ජනයාට ය.

© www.wsws.org